**ශීර්ෂය 176 වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

--------

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම

--------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව **රාජ්‍ය අමාත්‍යංශය** විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව **අමාත්‍යාංශයේ** මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5.** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ( ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

( ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 08කට අදාලව එකතුව රු. 63,077,100 ක්වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | අංක 21/1596/304/134 හා 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුවය ප්‍රතිපාදන ඉතිරි කිරීම, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ආයතන පරිශ්‍රය කොටස් කිරීමේ කටයුතු (Partition) සිදු කිරීමට නොහැකි වීම, ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීම, වර්ෂය තුල අපේක්ෂිත වියදම් සිදුනොවීම හා වර්ෂය තුළ කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන ලද සම්පූර්ණ වැඩකටයුතු අයවැය ඉක්මවා ගිය නමුත් ගෙවීම් සහතික නිකුත් කිරීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට ගතවන කාලය සමඟ ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් සම්පූර්ණ වැඩ සඳහා ගෙවීම් සිදු කර නොමැතිවීමයි යන කරුණු මෙම ඉතිරිවීම් සඳහා හේතු වී තිබුණි. | මු.රෙ. 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කල යුතු බව. |
| (ආ) | පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදන වර්ෂය අවසන් වනවිටත් උපයෝජනය කර නොතිබුණු අවස්ථා 06 කට අදාලව එකතුව රු.1,332,748 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. එසේ මාරු කර ගත් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතිරි වූ මුදල සියයට 26 සිට සියයට 252 ක් දක්වා වූ පරාසයක විය. | පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ . 66 යටතේ මරු කරගත් රු.1,332,748 ක ප්‍රතිපාදන ඉතිරි වීම සඳහා හේතුවී ඇත්තේ මෙහෙයුම් කල්බදු යටතේ මිලදීගත් වාහන සඳහා කල්බදු කාලය සැප්තැම්බර් මාසයේදී අවසන් වීමත් පැවති අයහපත් ආර්ථික තත්වය හමුවේ අපේක්ෂිත පරිදි කල්බදු කාලය දීර්ඝ නොකිරීමට කටයුතු කිරීමත්, අයවැය මඟින් වෙන්ව තිබූ ප්‍රතිපාදන වර්ෂය තුළ වියදම් සඳහා ප්‍රමාණවත් නොවූ නිසා වර්ෂයේ ඉදිරි කාලපර්ච්ඡේදය තුළ වියදම් දැරීමට සිදුව | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ඇතැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන සළසා ගත්තද අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීමත් යන කරුණු හේතු වී තිබුණි. | |
| (ඇ) | 2021 වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 94 ක් දක්වා ඉතිරියක් සහිත මූලධන වැය විෂයන් 9 ක රු.139,510,966 ක්ද, පුනරාවර්ථන වැය විෂයන් 12 ක සියයට 23 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරි කරන ලද රු.9,277,013 ක් ද වශයෙන් එකතු වටිනාකම රු.148,787,979 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. | 2021 වර්ෂය සඳහාවූ ශුද්ධ ප්‍රතිපදන්යෙන් මූලධන වැය විෂයන් 9 ක රු. 139,510,966 ක් ඉතිරිවීමට අංක 21/1596/304/134 හා 2021.08.3දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රතිපාදන ඉතිරි කිරීම්, වර්ෂය තුළ වියදම අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම්, ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීම නිසා වර්ෂය තුළ කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන ලද සම්පූර්ණ වැඩකටයුතු අයවැය ඉක්මවා ගිය නමුත් ගෙවීම් සහතික නිකුත් කිරීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට ගතවන කාලය සමඟ ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් සම්පූර්ණ වැඩ සඳහා ගෙවීම් සිදු කර නොමැතිවීම හා Covid 19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ මාස දෙකක් ප්‍රමාද වීම යන කරුණු හේතු වී තිබුණි.<br>වර්ෂය සඳහාවූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් පුනරාවර්තන වැය විෂයන් වල ඉතිරිවීම් ඇති වීමට අංක 21/1596/304/134 හා 2021.08.31දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රතිපාදන ඉතිරි කිරීම් හා අතිරේකව සලසාගත් ප්‍රතිපාදන ඉතිරි වීම සඳහා හේතුවී ඇත්තේ අයවැය මඟින් වෙන්ව තිබූ ප්‍රතිපාදන වර්ෂය තුළ වියදම් සඳහා ප්‍රමාණවත් නොවූ නිසා වර්ෂයේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ වියදම් දැරීමට සිදුව ඇතැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන සළසා ගත්තද අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීමය.<br><br>තවද 2021 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශයට අනුමත කර ඇති අයවැය මගින් 2021.08.31 දිනැති 21/1596/304/134 අංක දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුව මුළු ප්‍රතිපාදන ඉතුරු කිරීම් රු.මිලියන 30.35ක් වේ. | මු.රෙ. 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කල යුතු බව. |

**2.2. බැදීම් හා බැරකම් වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණන පරීක්ෂාවන් අනුව 2021 වර්ෂය සඳහා වූ රු.377,810 ක බැරකම් 2022 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසයන්හිදී නිරවුල් කර තිබුණු අතර මෙම වියදම් 2021 වර්ෂය සඳහා වූ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | එම බැරකම් වලට අදාල බිල්පත් 2021.12.31 දින වන විටද ගිණුම් අංශය වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොතිබුණ බැවින් 2021 වර්ෂයේ බැරකම් ලේඛනයට එකී බිල්පත් ඇතුලත් නොකරන ලදී .එම බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් වුයේ 2022 වර්ෂයේය. එම නිසා 2021 වර්ෂයේ බැරකම් ලේඛනයේ බැරකම් ලෙස හඳුනා නොගැණිනි. 2021 වර්ෂයට අදාල 2021 වර්ෂයේ ඉදිරිපත් වු සියලු බිල්පත් 2021.12.31 දිනට ගෙවා නිම කරන ලදී. | මු.රෙ.94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව බැරකම් වලට නොඑළඹිය යුතු බව. |
| (ආ) ව්‍යාපෘති දෙකකට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 06 ක් සඳහා ඉතිරිය ඉක්මවූ රු.372,469 ක බැරකම් වලට එළඹ තිබුණි. | -එම- | -එම- |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයෙන් බාහිර ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.119,200 ක් විය. ස්ථාන මාරුවී ගිය නිලධාරින් 02 දෙනෙකුගෙන් අයවිය යුතු මෙම ශේෂය වර්ෂ 16 කට වැඩි කාලයක සිට අයකර ගත නොහැකිව ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2021.12.31 දින වන විටත් අයකර ගැනීමට නොහැකිව තිබු ස්ථානමාරුවී ගිය දිනය නිශ්චිතව සඳහන් නොවන නිලධාරීන් 2 දෙනෙකුගෙන් අයවිය යුතු රු:119,200.00 ක් වූ ණය ශේෂ 1990 දශකය තරම් පැරණිය. එම ණය ශේෂ කපාහැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලද අතර එහි නිර්දේශය අනුව ණය ශේෂය කපාහැරීමට කමිටුවක් පත්කර කරුණු අධ්‍යයනය කර කමිටු වාර්තාව 2019.10.18 දින ඉදිරිපත් කරන ලදි. | හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිගු කලක සිට ඉදිරියට ගෙන එමින් පැවති වැඩ තහනම් කළ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.293,470 ක ණය මුදල 2021 වර්ෂය අවසන් වන විටත් අයකරගත නොහැකිව තිබුණි. | වැඩ තහනමකට ලක්වී ඇති ජේ.ඒ.ආරියසේන මහතාගෙන් අයවීමට නියමිත රු: 293,470.00 ක ණය ශේෂය, ඒ මහතාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මහාධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව මත එම නිලධාරියා අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩුව 2022.03.08 දින විභාගයට ගත් අතර එහි තීන්දුව අනුව ඔහු වරදකරු ලෙස ප්‍රකාශයට පත්කර ඇත. | හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කල යුතු බව. |

## 2.4 ගණන්දීමේ නිලධාරීන් විසින් සිදුකල යුතු සහතික වීම්

| නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම (නිරීක්ෂණය) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත** | වෙළඳ නාවික ලේකම් කාර්යාලය 1971 අංක 52 දරණ වෙළඳ නැව් පනත යටතේ ගාස්තු අයකිරීම සිදු කරනු ලබන අතර 2016 නොවැම්බර් 14 දිනැති ගැසට් පත්‍රය අනුව එම සේවාවන් වෙනුවෙන් ගාස්තු ඩොලර් වලින් ප්‍රකාශයට පත්කර තිබුණත් ගාස්තු අය කිරීමෙදි රුපියල් වලින් ගාස්තු අයකරනු බව නිරීක්ෂණය විය. මෙම සේවාවන් සැපයීම වෙනුවෙන් 2020 හා 2021 වර්ෂ වල උපයා ඇති ආදායම පිළිවෙළින් රු. 18,117,849ක් හා රු. 16,574,013 ක් විය. ඩොලර් මාධ්‍යයෙන් ගාස්තු අය නොකිරීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | ඩොලර් වලින් ගාස්තු අය කිරීම සඳහා ඩොලර් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව ඩොලර් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය අයදුම්පත්‍රය හා ලේඛන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | 2016 නොවැම්බර් 14 දිනැති ගැසට් පත්‍රය හා 1971අංක 52 දරණ වෙළඳ නැව් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| **(ආ) 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | අමාත්‍යාංශය විසින් සලසනු ලබන සේවා සඳහා අයකරනු ලබන, බාණ්ඩ 10ක් යටතේ වන උප ගාස්තු වර්ග 54 කට අධික සංඛ්‍යාවක් අවුරුදු 15කට අධික කාලයක් තුල සංශෝධනය කර නොතිබුණි. 2018 ජනවාරි 17 දිනැති හා අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සේවා සම්පාදනයේදී අයකරනු ලබන ගාස්තු සියයට | සේවා සම්පාදනයේදී අය කරනු ලබන ගාස්තු සංශෝධන කෙටුම්පත සකස්කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| | 15කින් සංශෝධනය කිරීම සඳහා උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව භාණ්ඩ 16කට අයත් ගාස්තු සංශෝධන කෙටුම්පත් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇතත් 2022 අප්‍රේල් 22 වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. තවද අඛණ්ඩ මුදාහැරීමේ සහතික පත්‍ර, ප්‍රවීණතා නිකුත් කිරීම්, යාවත්කාලීන කිරීමේ හා අග්‍රිමපත් නිකුත් කිරීමේදී අයකල ගාස්තු 2017 පෙබරවාරි 01 දින සිට සංශෝධනය කර තිබුණත්, එම සංශෝධනයන් පිළිබඳ ගැසට් නිවේදන මගින් 2022 අප්‍රේල් 30 දින දක්වාම ප්‍රසිද්ධ කර නොතිබුණි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**---------------------------**

**3.1. විදේශ ආධාර ව්‍යාපෘති**
**-------------------------**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------------------ | ------------ |
| **(අ)** ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කොළඹ උතුරු වරාය සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් 2021 වර්ෂයේ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. 380,000,000 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට වියදම රු. 286,943,711 ක් වී තිබුණි . ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයට අදාල උපදේශනාත්මක සේවා හා ඉංජිනේරුමය කාර්යයන් 2020 දෙවන කාර්තුව වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ නමුත් | **176-2-4-25-2506 කොළඹ උතුර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනය** සැලසුම් කල පරිදි 2021 වර්ෂය තුල ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කළ අතර ඊට අදාල 2021 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා ගෙවීම් ඉන්වොයිසියන් අදාල උපදේශන කණ්ඩායම (AECOM) විසින් වරාය අධිකාරියට ඉදිරිපත් කර තිබුණි. නමුත් එම ගෙවීම් ඉන්වොයිසියන්ගේ පැවති අංක ගණිත දෝෂයන් නිසා එකී උපදේශන සේවයට ගෙවීමට තිබුණු මුදල දෝෂ සහිතව සටහන්වී ඇත. මෙම ගැටළුව පිළිබඳව එම ආයතනය දැනුවත් කළ | සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බැලීමක් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් අදාල කොන්ත්‍රාත්තුව ලබා දීම 2020 පෙබරවාරි 24 දක්වා ප්‍රමාද වී තිබුණි. කොන්ත්‍රාත් මිල GBP මිලියන 0.85, එක්සත් ජනපද ඩොලර් මිලියන 2.03 ක් හා රුපියල් මිලියන 66.17 ක් ද වේ. කොන්ත්‍රාත්තුව මාස 15කින් නිමකිරීමට නියමිතව තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට කාර්ය සාධන වාර්තාව අනුව උපදේශාත්මක සේවාවල භෞතික ප්‍රගතිය 75% ක් වී තිබුණි. | අතර ඉහත දෝෂ නැවත නිරවද්‍යාකර කණ්ඩායම් නායකයාගේ (Team Leader) තහවුරු කිරීමද සමග 2022 පෙබරවාරි මස නැවත වරාය අධිකාරිය වෙත ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණි. එම නිසා 2021 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා සිදු කරන ලද ව්‍යාපෘති කාර්යයන් සඳහා ගෙවීම් කටයුතු 2022 පෙබරවාරි මසදී ආරම්භ කරන ලදි. ඉහත කරුණු අනුව සැලසුම් කළ කාර්යයන් සිදු කර තිබුණද ඊට අදාල ගෙවීම් 2021 වර්ෂය තුළදී සිදුකිරීමට අවස්ථාවක් නොලැබුණි. | |
| **(ආ)** | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන කුළුණු මතින් ඉදිවෙන වරාය පිවිසුම් අධිවේග මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 210 ක් වූ අතර වර්ෂය අවසානයේ වියදම රු. මිලියන 107.5ක් වී තිබුණි. අදාල වරාය පිවිසුම් අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා ඉවත් කරන ලද අධිකාරියට අයත් වැඩහල් (work shops) නැවත ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු මස 06 වන දින BEL- DGESJV ආයතනයට භාරදී තිබුණි. එසේම අදාල කාර්යයන් 2021 සැප්තැම්බර් 09 වන දින ආරම්භ කර තිබුණි. එම කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 1,090 වන අතර කොන්ත්‍රාත් කාලය මාස 09ක් වී තිබුණි. කාර්ය සාධන වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 12 %ක් වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය මස 09 කින් අවසන් කළ හැකි ව්‍යාපෘතියක් ලෙස සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ මූලික සැලසුම් කටයුතු අවසන් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතරතුර නැවත ඇස්තමේන්තු කිරීමට සිදුවූ බැවින් අදාල විධිමත් අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාද විය. කෙසේවුවද ව්‍යාපෘතිය අගෝස්තු මස අදාල කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලද අතර ආරම්භ කිරීමේ නියෝගය 2021 සැප්තැම්බර් මස නිකුත් කරන ලදී. 2021 වසරේ ඉටුකිරීමට හැකි කාර්යන් ඉතිරිව ඇති මාස 03 සඳහා සලකා බැලීමේදී මුදාහරියහැකි අත්තිකාරම් මුදල (Mobilization Advance) (කොන්ත්‍රාත් වටිනාකමින් 10%) රුපියල් මිලි. 107 ක් පමණි. ව්‍යපෘති කාලය 2022 ජූලි මස අවසන්කිරීමට නියමිත බැවින් ඉතිරි ගෙවීම් 2022 වර්ෂය තුල සිදුකෙරේ. | සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බැලීමක් කල යුතුයි. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයට අයත් වටිනාකම රු.10,500,000 ක් වූ මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට අයත් රු.6,000,000 ක් වටිනා මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කමක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් රු.4,500,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | KS 2992 දරණ මෝටර් රථය මූල්‍ය නොවන වත්කම් යටතේ රු.10,500,000 ක මුදල ගිණුම්ගත කර නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | විධිමත් ක්‍රියා පටිපාටීන් අනුව වත්කම් පවරා ගැනීමට හා පවරා දීමට කටයුතු කල යුතු බව හා වත්කම් ලේඛන නිවැරදිව පැවැත්විය යුතු බව. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ මට්ටමේ පුරපුපාඩු 03ක් හා නාවික ලේකම් කාර්යාලයේ ඉංජිනේරුමය අංශ වලට අයත් නාවික වෘතිකයන්ගේ පුරප්පාඩු 06 ක්ද ඇතුලුව ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 17ක්ද පැවතුණි. තවද, අමාත්‍යාංශයේ තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටම්වල දෛනික කාර්යයන් සඳහා සෘජුව බලපාන සේවක පුරප්පාඩු 14ක්ද නාවික ලේකම් කාර්යාලයේ සියලු මට්ටම්වල පුරප්පාඩු 50 ක්ද පැවතුණි. | මෙම අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා පුරප්පාඩු සේවක සංඛ්‍යාව සපයා දෙන මෙන් රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත කිහිප අවස්ථාවකදීම ලිපි මගින් දැනුවත් කිරීම් සිදු කිරීම මගින් වර්තමානය වන විට ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්ද තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 07ක් වශයෙන්ද පුරප්පාඩු සංඛ්‍යාව අඩු කර ගැනීමට හැකි වී ඇත. එවකට පැවති පුරප්පාඩු නිසා අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍යන් විධිමත්ව කරගෙන යාමේදී බාධාවක් වී තිබුන බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ නාවික වෘත්තිකයන්ගේ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි අවස්ථාවලදී කොන්ත්‍රාත් පදනම මත සුදුසු නාවික වෘත්තිකයන් බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය අමප/13/0709/505/029 හා 2014.02.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දීම මත නාවික වෘත්තිකයින් බඳවා ගැනීමට කටයුතු කර ඇත. | අමාත්‍යාංශයේ කාර්යය හා කරතව්‍යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වා ගත යුතු බව. |

එහෙත් පසුගිය වසර තුළ කොන්ත්‍රාත් පදනම මත නාවික වෘත්තිකයින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ අතර ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට 2020 වර්ෂයේ සිට අවශ්‍ය කටයුතු සිදු කර අයදුම්පත් කැඳවීමේ නිවේදනය ගැසට්පත්‍රයේ පලකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතුනද 2022.04.26 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි VII වන වගන්තියෙහි දක්වා ඇති උපදෙස් පරිදි අදාල බඳවා ගැනීම් තාවකාලිකව කල් තබන ලදී. එසේ වුවද අදාල උපදෙස් නිකුත් වූ වහාම එම බඳවා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතව ඇත. වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ තෘතියික, ද්විතියක සහ ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු තනතුරු 50ක් පවතින බව දක්වා ඇති අතර, පුරප්පාඩු ඇතිවූ අවස්ථාවල සහ ඉන් පසුව එම තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදී ම දැනුම් දී ඇත. එමෙන්ම, 2021.12.31 දින වන විට අභ්‍යාසලාභී උපාධිධාරීන් 06 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන් 06 දෙනෙකුද කාර්මික විද්‍යාලවල පුහුණුව අවසන් කරන ලද සිසුන් ද මාස 06 බැගින් පුහුණුව සඳහා මෙම කාර්යාලයට අනුයුක්ත කර ගැනීමට කටයුතු කරන ලදී.